M 230

# අධ්‍යාපනික සාධනයෙහිලා සිසුන්ගේ
# සමාජ ආර්ථික තත්වයන් බලපාන ආකාරය
# පිළිබඳ අධ්‍යයනයක්.

(කළුතර දිස්ත්‍රික්කය ඇසුරෙන්)

1986 අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා
ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධය.

M. PHIL 67 (1978)

ජේ. ඒ. පී. ආරියරත්න,
බී. ඒ. (පේරාදෙණි),
අධ්‍යාපන ඩිප්ලෝමා (කැළණිය)
-සම්මාන-

අධ්‍යාපන පීඨය,
කොළඹ විශ්ව විද්‍යාලයය,
කොළඹ.

1986 මාර්තු මස 31 වැනි දින.

UCLIB
403432

# සංක්ෂේපයක්

රටක සමාජයීය හා ආර්ථික සංවර්ධන අරමුණු සපුරා ගැනීමට අවශ්‍ය වන පුහුණු මිනිස් බල සම්පත් උත්පාදනය කිරීම, වර්තමාන අධ්‍යාපන ක්‍රමයේ වැදගත් වගකීමක් ලෙස පිළිගනු ලැබේ. ලෝකයේ 'සංවර්ධිත' මෙන් ම 'සංවර්ධනය වෙමින් පවතින' රටවලට ද මෙය එකසේ වැදගත් වේ. මෙම පදනම මත පිහිටා ක්‍රියා කරන විට රටක සමාජයීය හා ආර්ථික තත්වය ඉතා වැදගත් අංශ දෙකක් මෙන් ම එකිනෙකට අනුබද්ධ අංශ දෙකක් ලෙස ද පිළිගත හැකි වේ. එහෙයින් රටක 'අධ්‍යාපනය' එම රටේ සමාජයීය හා ආර්ථික තත්වය මනාව පිළිබිඹු කරන කැඩපතක් ලෙස හැඳින්විය හැක.

මෙසේ අධ්‍යාපනය හා සමාජ-ආර්ථික රටාව අතර පවත්නා සම්බන්ධතාව ගැන අවධානය යොමු කළ විට සිසුන්ගේ හැකියා හා දක්ෂතා විදහා දක්වන එක්තරා මාධ්‍යයක් ලෙස ඔවුන්ගේ සාධනය සැළකිය හැකිය. ශිෂ්‍ය අධ්‍යාපනික සාධනයට ඔවුන්ගේ සමාජ-ආර්ථික පසුතලය බලපාන බව නොරහසකි. එම පදනම මත පිහිටා ශ්‍රී ලංකාවේ එක් අධ්‍යාපන දිස්ත්‍රික්කයක් වන කළුතර ආශ්‍රයෙන් සිසුන්ගේ අධ්‍යාපනික සාධනය පිළිබඳ ව කවර බලපෑමක් ඔවුන්ගේ සමාජ-ආර්ථික රටාව දක්වන්නේ ද යන්න මෙම අධ්‍යයනයේ දී පිරික්සීමට භාජනය වේ.

ශිෂ්‍ය සාධනය කෙරෙහි සමාජ-ආර්ථික තත්වයේ ඇති බලපෑම ගැන විමසීමේ දී විවිධ පර්යේෂකයන් හා අධ්‍යාපනඥයන් ඉදිරිපත් කර ඇති මත සැළකිල්ලට ගෙන තිබේ. ශ්‍රී ලංකාවේ අනිකුත් අධ්‍යාපන දිස්ත්‍රික්ක **සමග** සසඳන විට සමාජ-ආර්ථික රටාවේ බලපෑම් පිළිබඳ නිරූප්‍ය තත්වයක් දක්නට තිබේ ය යන උපකල්පනය මත මෙම අධ්‍යයනය සඳහා කළුතර අධ්‍යාපන දිස්ත්‍රික්කය තෝරා ගනු ලැබිණ. දිස්ත්‍රික්කයේ ශිෂ්‍ය නියෝජනයේ ප්‍රමුඛභාව පදනම් කොට ගෙන නියැදිය තෝරා ගනු ලැබූ අතර, විශේෂයෙන් ම දත්ත රැස් කිරීමේ ක්‍රියා පිළිවෙත වූයේ, **ප්‍රශ්නාවලියක්** අනුගමනය කිරීමයි. සංවර්ධනය වන රටක් වශයෙන් 1943 සිට නිදහස් අධ්‍යාපනයේ ආශිර්වාදය ලබන ශ්‍රී ලංකාවේ එක් අධ්‍යාපන දිස්ත්‍රික්කයක් ඇසුරෙන් ලබා ගත් තොරතුරු දිවයිනට ම සාමාන්‍යකරණය කිරමේ ඇති හැකියාව ගැන ද අවධානය මෙහි දී යොමු කර ඇත.

පර්යේෂණ කාර්යය සංවිධානය කිරීමේ දී අධ්‍යාපනික සාධනය හා සමාජ-ආර්ථික තත්වය ආශ්‍රිත පර්යේෂණ **සාහිත්‍යය** විමර්ශනයේ දී මෙම සාධකයන්ගේ බලපෑම වඩාත් පුළුල් තත්වයකින් පැවැති බව පෙනී ගිය නිසා එම තොරතුරු අංශ තුනක් යටතේ ගොනු කරනු ලැබිණ. එනම්, ශිෂ්‍යයා, පුළුල් සමාජය හා ආර්ථික තත්වයක්, ශිෂ්‍යයා හා ඔහුගේ පාසල් සමාජීය වාතාවරණයක්, ශිෂ්‍යයා හා ඔහුගේ සමකල්ලියන්(සම වයස් කණ්ඩායම) යනු අනු තේමා යටතේ ශිෂ්‍ය සාධනය කෙරෙහි සමාජ-ආර්ථික කරුණුවල බලපෑම සම්බන්ධ දෙස විදෙස් පර්යේෂණ සාහිත්‍ය තොරතුරු විමැසුමට ලක් කොට තිබේ.

අධ්‍යයනයට යොදා ගත් අරමුණු 05 ක්වූ අතර ඒ අරමුණු පදනම් කර ගෙන ශ්‍රී ලංකාවේ අධ්‍යාපනික සාධනය විමැසීමට ලක් කෙරේ. පස් වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව සාමාර්ථ මට්ටම, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සාමාර්ථ මට්ටම, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සාධන මට්ටම යන විභාග ඵලයන්ට අදාළව ශිෂ්‍ය නිඝැදි තුනක් තෝරා ගනු ලැබිණ. ශිෂ්‍ය සංඛ්‍යාවේ ප්‍රමාණය මත දිස්ත්‍රික්කයේ මණ්ඩල 05 ක් තෝරා ගෙන, පිරිමි ළමුන් 30 ක් හා ගැහැණු ළමුන් 30 ක් යනුවෙන් 60 ක ශිෂ්‍ය නියැදියක් මගින් මුළු මණ්ඩල 05 න්ම සිසුන් 300 ක්, 05 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව මට්ටම සඳහා වූ නියැදිය ලෙස තෝරා ගැනිනි. මේ අන්දමට අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පරීක්ෂණ මට්ටම සඳහා සිසුන් 300 ක්ද, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) පරීක්ෂණ මට්ටම සඳහා සිසුන් 300 ක්ද තෝරා ගනු ලැබිණ. මුළු පොදු නියැදියට සිසුන් 900 ක් අයත් වේ. පොදු නියැදියට අමතර ව සිසුන්ගේ දෙමව්පියන්ගේ රැකියා මට්ටම ආශ්‍රයෙන් සිසුන් 100 ක් යොදා ගෙන සුවිශේෂ අධ්‍යයනයක් ද හොරණ මණ්ඩලය ආශ්‍රයෙන් කරන ලදී. මේ අනුව සමස්ථ නියැදියේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 1000 ක් වේ. දත්ත රැස් කිරීමේ ක්‍රියා පිළිවෙතේදී පොදු හා විශේෂ කරුණු ඇතුළත් වන අයුරින් සකස් කරන ලද ප්‍රශ්නාවලියකින් දත්ත රැස් කර ගන්නා ලදී. ප්‍රධාන අභ්‍යුපගමන 06 ක් මත පිහිටා දත්ත විශ්ලේෂණය කරන ලද්දේ කයි වර්ග පරීක්ෂණය පදනම් කර ගෙනය.

දෙමව්පියන්ගේ උගත්කම්, රැකියා තත්වයන්, පවුලේ ආදායම, නිවෙස්වල තත්ව, ගේදොර ආර්ථික පසුබිම, පදිංචි බල ප්‍රදේශය යන සාධක 06 ක් ශිෂ්‍ය සාධනයක් පදනම් කොට ගොඩ නගන ලද අභ්‍යුපගමන 06 ක් අනුසාරයෙන් ප්‍රශ්නාවලියෙන් ලබා ගත් දත්ත කයි වර්ග පරීක්ෂණයට භාවිතය කරන ලදී. 05 වන ශ්‍රේණියේ ශිෂ්‍යත්ව සාධනය ආශ්‍රයෙන් කළ අභ්‍යුපගමනය පරීක්ෂණ

තොරතුරු අංක: 4.1 සිට 4.29 දක්වා වූ වගුවලද, අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) පරීක්ෂණ තොරතුරු ඇසුරෙන් කරන ලද අභ්‍යුපන්‍යාස පරීක්ෂණ තොරතුරු අංක: 4.30 සිට 4.57 දක්වා වූ වගුවල ද, අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) සාධනමය තොරතුරු ආශ්‍රිතව කළ අභ්‍යුපන්‍යාස පරීක්ෂණ තොරතුරු අංක: 4.58 සිට 4.85 දක්වා වූ වගුවල ද අඩංගු කර තිබේ. සුවිශේෂ අධ්‍යයනය ආශ්‍රිත දත්ත විශ්ලේෂණය අංක: 4.86 සිට 4.108 දක්වා වූ වගුවලින් ඉදිරිපත් කෙරේ.

විභාග මට්ටම් තුන ආශ්‍රිත දත්ත වලින් හා සුවිශේෂ අධ්‍යයනයට අදාළ දත්ත වලින් ද, දෙමව්පියන්ගේ උගත්කම, රැකියා තත්වය, නිවෙස්වල තත්ව, ගේදොර ආර්ථික පසුබිම ආදියෙහි ධන සම්බන්ධතා පෙන්නුම් කළ බව අනාවරණය විය. පදිංචි බල ප්‍රදේශය හා පවුලේ ආදායම ආදී විචල්‍යයන්හි සමහරකැ පමණක් ඍණ සම්බන්ධතාවයක් පෙන්නුම් කරන ලදී. එහෙත් සමස්ත දත්ත විශ්ලේෂණ තොරතුරුවලින් අනාවරණය වූයේ සමාජ-ආර්ථික තත්වය ශිෂ්‍ය අධ්‍යාපනික සාධනය කෙරෙහි බලපාන බවය.